

# සංඛ්‍යා පටිපාටිගත කිරීම

සැකසුම- වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



## ක්‍රියාකාරකම

### ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය:

- ❖ අංක 1-100 තෙක් සංඛ්‍යා ලියූ 5cm x5cm ප්‍රමාණයේ කාඩ්පත් 100ක්
- ❖ පේපර් ප්ලේට් 3ක්
- ❖ මදටිය ඇට හෝ එවැනි ද්‍රව්‍ය 100ක්
- ❖ කාඩ්පත් සියල්ලම පහත ආකාරයට මේසයක් මත හෝ පොළොව මතුපිට විසුරුවන්න. ඒ සඳහා ඔබ දරුවාට සහාය වෙන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| 17 | 18 | 19 | 20 | 21 | 22 | | |

……………. ලෙසට

- ❖ සංඛ්‍යාපත් සියල්ලම කියවීමට අවශ්‍ය සහයෝගය දරුවාට ලබා දෙන්න.
- ❖ ඉහත සංඛ්‍යාපත් වලින් ඕනෑම සංඛ්‍යාපත් දෙකක් තෝරා ගැනීමට පවසන්න.
- ❖ ලබාගත් සංඛ්‍යාපත් සඳහා එහි ඇති අගයට ගැළපෙන ද්‍රව්‍ය ප්‍රමාණයන් (මදටිය බීජ හෝ වෙනත් ද්‍රව්‍ය) කාඩ්පතට පහළින් පේපර් ප්ලේට් එක තබා , දමන්න සළස්වන්න.

උදා:-




❖ ඉහත ද්‍රව්‍ය ප්‍රමාණයන් සසඳා විශාල සංඛ්‍යාව සහ කුඩා සංඛ්‍යාව තෝරා කුඩා සංඛ්‍යාව පළමුවත් විශාල සංඛ්‍යාව දෙවනුවත් තබන්න, දරුවාට පවසන්න.
මේ ආකාරයට වාර ගණනාවක් කරන්න.

❖ පසුව කාඩ්පත් තුනක් තෝරා ගෙන එයද ඉහත ආකාරයට කුඩා සංඛ්‍යාවේ සිට විශාල සංඛ්‍යාවට පටිපාටිගත කිරීමට මඟ පෙන්වන්න.

❖ එම සංඛ්‍යා අභ්‍යාස පොතේ ද සටහන් කරවන්න.

